# <u>දියමන්ති මාලය</u>

විෂය : සිංහල සාහිත්‍ය සංග්‍රහය
ශ්‍රේණිය : 11
වාරය : 111
නිපුනතා මට්ටම :

## <u>ක්‍රියාකාරකම්</u>

පාඩම හොඳින් කියවන්න. අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

01) කෙටි පිළිතුරු ලියන්න.

i. දියමන්ති මාලය කෙටි කතාවේ කතුවරයා කවරෙක් ද?
ii. ඔහු නිකම් ජාතිකයෙක් ද?
iii. අප රටේ දක්ෂ පරිවර්තන සාහිත්‍යකරුවන් දෙදෙනෙකු නම් කරන්න.
iv. දියමන්ති මාලය කෙටි කතාවේ පරිවර්තකයා නම් කරන්න.
v. අනුවර්තනය හා පරිවර්තනය අතර වෙනස දක්වන්න.

02) මැටිල්ඩා ලොයිසල්ගේ චරිතය ඇසුරින් පිළිතුරු ලියන්න.

i. මැටිල්ඩා නිරන්තරයෙන් දුක් වේදනාවලට භාජනය වූයේ ඇයි?
ii. "ඇය ඒවා පිළිබඳ කල්පනාවෙන් මනෝලෝකයක ජීවත් වූවා ය" මෙහි ඒවා යනු මොනවා ද?
iii. මැටිල්ඩා සිය මිතුරිය බැලීමට යාම නතර කළේ ඇයි?
iv. ඇය සිතින් මවා ගත් ප්‍රාර්ථනාවන් තුනක් පිළිබඳව පාඩමේ දැක්වේ. ඒ මොනවා ද?
v. ඇය පිළියෙල කළ ඇඳුම සඳහා වියදම් වූ මුදල කීය ද?
vi. මැටිල්ඩාට අනුව ඉතාම ලජ්ජා සහගත වැඩය කුමක් ද?
vii. උත්සව අවස්ථාවේ දී ඇගේ ප්‍රාර්ථනා ඉෂ්ට වූයේ ද? ඒ කෙසේ ද?
viii. නැති වූ මාලය වෙනුවට මාලයක් මිලදී ගැනීමට ඔවුහු බොහෝ වෙහෙස වූහ. ඒ සඳහා මැටිල්ඩා කළ කැප කිරීම් දක්වන්න.
ix. ඇතැම් තැනක දී පාඨක සිත මැටිල්ඩා කෙරෙහි දයාර්ද බවක් ඇති වේ. එවැනි අවස්ථා මොනවා ද?

03) ලොයිසල් මහතාගේ චරිතය ඇසුරින් පිළිතුරු ලියන්න.

i. ලොයිසල් මහතා සේවය කරන ආයතනය හා තනතුර දක්වන්න.
ii. සිය බිරිඳ සතුටු කිරීමට ඔහු වදෙන් පොරෙන් ලබා ගත් දෙය කුමක් ද?
iii. උත්සවයට යැමට අවශ්‍ය ඇඳුමට දෙන මුදල ඔහු කවර කාරණයක් සඳහා ඉතිරි කරන ලද මුදල් ද?

iv. උත්සව දින ඔහු හිස් පාළු කාමරයක නින්දෙන් පසු වූයේ ඇයි?
v. ඔහු නැති වූ මාලය සොයා ගැනීම ගැන දැනුවත් කළ ආයතන මොනවා ද?
vi. ලොයිසල් මහතා ණය ගෙවීම සඳහා මුදල් උපයා ගැනීමට කටයුතු කළේ කෙසේ ද?
vii. ඒ සඳහා ඔහු කළ අමතර කාර්යය මොනවා ද?
viii. සියලු ණය ගෙවා නිදහස් වීමට ඔවුන්ට ගත වූ කාලය කොපමණ ද?

04) පහත දැක්වෙන ප්‍රකාශ කවුරුන් විසින් කාහට කියන ලද ඒවා දැයි සොයන්න.

- මැටිල්ඩා හා ලොයිසල් අතර කතා බහ ඉදිරියේ √ ලකුණ යොදන්න.
- මැටිල්ඩා හා ෆොරෝස්ටියර් මැතිනිය අතර සිදුවූ ඒවා ඉදිරියේ □ ලකුණ යොදන්න.

i. "මටත් ඒක ඕන කෙරුවා නම්" ( )
ii. "මල් ටිකක් ගහ ගන්නකෝ" ( )
iii. "ලිපිකරුවන්ට ලැබෙන්නේ බොහොම ටිකයි" ( )
iv. "මේවයින් ඔයාට ඕන එකක් තෝරා ගන්න" ( )
v. "අපි ආපු පාර දිගේ ආපහු පයින් ම මං යන්නම්" ( )
vi. "හරියටම කියන්න බෑ" ( )
vii. "මට ඒක ඔයා ආපහු ගෙනවිත් දුන්නා නෙ" ( )

05)

i. ගී ද මෝපසන් දියමන්ති මාලය කෙටිකතාව පුරාම ඉතා අපූරු භාෂා රටාවක් සිත්තම් කරයි. එහිදී ඔහු "ශෝකය" ප්‍රකාශ කිරීමට යොදා ඇති පද රාශියකි. තෝරා ලියන්න.
ii. "සතුට" ප්‍රකාශ කිරීම සඳහා කතුවරයා යොදා ගත් පද ලියන්න.

06) කතුවරයා කෙටිකතාව රසවත් කිරීමෙහිලා යොදා ගත් භාෂාවේ තවත් ලක්ෂණයකි, යුගල පද. තෝරා ලියන්න.

## <u>විචාර ලියන්න</u>

01) "අසීමිත ආශාවන් පසුපස හඹා යෑමෙන් අනන්ත වූ කරදර, හිරිහැරවලට මුහුණ දීමට සිදුවේ". දියමන්ති මාලය කෙටිකතාව ඇසුරින් මෙම කරුණ උදාහරණ දක්වමින් සාකච්ඡා කරන්න.

02) අධ්‍යාපන අමාත්‍යාංශයේ සුළු ලිපිකරුවකු වන ලොයිසල් මහතාගේ චරිතය

අ) අවංකත්වයෙන් පිරි

ආ) යහපත් සැමියෙකු ලෙස කෙටිකතාව මුළුල්ලේම නිරූපණය වේ.

උදාහරණ දෙමින් විමසීමට ලක් කරන්න.

<u>පිළිතුරු</u>

01)

i. ගී ද මෝපසං
ii. ප්‍රංශ
iii. ඒ.පී.ගුණරත්න / කේ.ජී.කරුණාතිලක
iv. කේ.ජී.කරුණාතිලක
v. අනුවර්තනය - වෙනත් භාෂාවකින් පෙරළන භාෂාවට / අයිති වචන යොදා සකස් කිරීම

 පරිවර්තනය - යම් භාෂාවක වචන ඒ අයුරින් ම පදයෙන් පදය වෙනත් භාෂාවකට හැරවීම.

02)

i. තමා ඉපදී ඇත්තේ සියලු ම සැප සම්පත් හා සුඛ විහරණ ආස්වාදය කිරීමටය යන හැඟීම නිසා.
ii. සූක්ෂම කර්මාන්තයන්ගෙන් හෙබි ගෘහභාණ්ඩ, එල්ලන ලද පුරාණ සේද තිර, අති විශාල ශාලා, චිර ප්‍රසිද්ධ, විශ්වාසී මිතුරන් ස්වල්ප දෙනෙකුත් ප්‍රිය සමාගමය සඳහා වූ සුගන්ධවත් සුන්දර ආගාර, දැවැන්ත ආවතේව කරුවන්.
iii. පෙරළා ආ සෑම විටම බලවත් චිත්ත සන්තාපයට පත් වී හඬා වැලපීම.
iv. අන්‍යයන් වශී කර ගැනීම, අන්‍යයන් විසින් ප්‍රාර්ථනා කරනු ලැබීමත්, බෙහෙවින් ප්‍රියංකර වීමෙන් අන්‍ය මන නුවන් පොලොඹවා ගැනීම.
v. ප්‍රන්කූ හාරසියය
vi. පොහොසත් ගෑනු මැද්දේ දුප්පත් විදියට ඉන්න එක.
vii. සෑම පිරිමියෙක්ම දල්වා ගත් දෙනෙතින් ඇයට බැලුම් හෙළීම, ඇය සමග නැටුමට සෑම නිලධාරියෙකු ම උත්සාහ ගැනීම... වැනි
viii. සේවිකාව අස්කර දැමීම, නිවෙස වෙනස් කර කුඩා කාමරයට යාම, ගෙදරක සියලුම වැඩ පල ආයාසයෙන් යුතුව ඉටු කිරීම, සෑම තඹයක් ම ඉතිරි කර ගැනීමට අධික නින්දා අපහාස විඳිමින් කටයුතු කිරීම.
ix. ගෙදර දොරේ කටයුතුවල නිරත වන අවස්ථා, විවේක අවස්ථාවල උත්සවය පිළිබඳ සිතිවිලිවල නිමග්නව සිටීම, ෆොරෙස්ටියර් මැතිනියට මාලය පිළිබඳ තොරතුරු කියූ අවස්ථාව.

03)

i. අධ්‍යාපන අමාත්‍යාංශය - සුළු ලිපිකරු තනතුරක්
ii. ආරාධනා පත්‍රයක් - ප්‍රිය සම්භාෂණය සඳහා වූ
iii. තුවක්කුවක් මිල දී ගැනීමට
iv. සිය බිරිඳව අවශ්‍ය තරම් සතුටු වීමට ඉඩ ලබා දීමට
v. පොලිස් ස්ථානය, ප්‍රවෘත්ති පත්‍ර කාර්යාලයට, කුලී රථ සමාගම්වලට
vi. දිවා කල ලිපිකරු තනතුරේ රාජකාරි කිරීම, සවස් කල වෙළඳ ආයතනවල ගිණුම් වාර්තා සකස් කිරීම, රාත්‍රී කාලයේ පොත් පිටපත් කිරීම

vii. මුදල් ණයට ගැනීම, විනාශකාරී ගිවිසුම් වලට එළඹීම, පොලීකරුවන් සමඟ බැඳුම්වලට එළඹීම, අනාගතයේ දී විසඳීමට සිදුවන සියලු දුක් පීඩා කම්කටොල් ගැන නොසිතා ණයට ගැනීම.

viii. අවුරුදු 10ක්

04)

i. □

ii. √

iii. √

iv. □

v. √

vi. √

vii. □

05)

i. අසන්තෝෂය, දුක් වේදනා, සිත් තැවුල, මනස්තාපය, ශෝකය, දොම්නස, දොම්නස් සහගත කටුක සිතුවිලි, චිත්ත සන්තාපය, දුක, සංවේගය, ශෝකය, කම්පාව, පසුතැවිල්ල, වේදනාව

ii. ප්‍රීති, මහත් ප්‍රබෝධයක්, මදහසක්, ප්‍රහර්ෂය, ප්‍රමෝදයකින්, සන්තොෂයකින්, සොම්නස, ආශ්චර්ය, ආහ්ලාදය, ආනන්දය

06) හැඩ වැඩ, අල්ලාප සල්ලාප, වැඩ පළ, ගමනක් බිමනක්, වදෙන් පොරෙන්, තෝරලා බේරලා, දීසි පීරිසි, රෙදි පෙරදි, ඇඳුම් පැලඳුම්, සණ්ඩු සරුවල්, ණය තුරස්

<u>විචාර ලිවීම</u>

07) සුදුසු උදාහරණ යොදා ගනිමින් ( අවම වශයෙන් තුනක්වත්) විචාරයක යෙදෙන්න.

* පහත උධෘත යොදා ගන්න.

" හැඩ වැඩ ඇතිව ඇදීමට පැලඳීමට... වාම්ව ඇන්දා ය..... පැලැන්දා ය."

"...ඇය විසින් ජීවත් වූයේ තමාට තරම් නොවන පහත් විවාහයකට මැදිහත් වූ එකියක මෙන් අසන්තෝෂයෙනි."

" සිතින් මවාගත් ඇ ඒවා පිළිබඳව කල්පනාවෙන් මනෝ ලෝකයක ජීවත් වූවා ය."

" ...එහෙත් ඇය ආශා කළේ ද ඒවාට මය..."

"... සන්තාපයට ද ගොදුරක් ව හඬා වැලපීම සිරිතක් වූයේ ය"

" මේ වන විට ලොයිසල් මහත්මිය මහලු පෙනුමකින් යුතුව සිටියා ය"

"කොහොම හරි අපි ඒ ණය ටික ගෙවලා ඉවර කෙරුවා; ඒක මගේ හිතට ලොකු සතුටක්."